Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2001 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர (உயர் தரப்) பரீட்சை, 2001 ஆகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2001

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S II

පැය දෙකයි / இரண்டு மணித்தியாலம் / Two hours

## I. කොටස

'අ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරා ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. භාණ්ඩ සහ සේවා නිෂ්පාදනයේදී සෑම සමාජයක් ම තෝරා ගැනීමේ ප්‍රශ්නයකට මුහුණ දේ යැයි අප කියන්නේ ඇයි?
   (i) මිනිස් අවශ්‍යතා අසීමිත වීම. (ii) ආර්ථික උසස් සංවර්ධිත ඒවා වීම.
   (iii) මිනිස් අවශ්‍යතාවලට සාපේක්ෂව සම්පත් හිඟ වීම සහ සම්පත් විකල්ප අයුරින් භාවිත කළ හැකි වීම.
   (iv) කිසියම් භාණ්ඩ සහ සේවා ප්‍රමාණයක් විවිධ නිෂ්පාදන සාධක සංයෝග යොදා ගෙන නිපැදවීමට හැකිවීම.

2. නොමිලේ සැපයෙන පහත දක්වෙන භාණ්ඩ හා සේවා අතරින් ආවස්ථික පිරිවැයක් පවතින ඒවා මොනවා ද?
   (i) රජයෙන් සැපයෙන නිදහස් අධ්‍යාපනය (ii) රෙදි වේලීම සඳහා භාවිත කෙරෙන හිරු එළිය
   (iii) සිසුන්ට ලැබෙන මහපොළ ශිෂ්‍යත්ව (iv) සංචාරක ආකර්ෂණයක් බවට පත් ව ඇති දිය ඇල්ලක්

3. සමාජයක මූලික ආර්ථික ප්‍රශ්නයක් වශයෙන් කා සඳහා නිපැද වේ ද යන්නෙන් කුමක් අදහස් වේ ද?
   (i) නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීමේ දී නිෂ්පාදකයෙකු ඉලක්ක කර ගන්නා පාරිභෝගික කණ්ඩායම
   (ii) නිපදවන්නේ අපනයනය සඳහා ද නැතහොත් දේශීය වෙළෙඳපොළ සඳහා ද
   (iii) නිපදවන්නේ පරිභෝජනය සඳහා ද නැතහොත් ආයෝජනය සඳහා ද
   (iv) ආර්ථිකයේ නිමැවුම කුටුම්භ අතර බෙදී යන්නේ කෙසේ ද?

4. මූලයට අවතල නිෂ්පාදන හැකියා වක්‍රයක් උපකල්පනය කරන්න. එවැනි වක්‍රයක් දිගේ පහළට ගමන් කිරීමකින් කුමක් දක්වේ ද? වඩාත් ම නිවැරදි පිළිතුර දක්වන්න.
   (i) එක් භාණ්ඩයක නිෂ්පාදනය අඩුවීමක් සහ අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනය වැඩිවීමක්
   (ii) කිසියම් සම්පත් ප්‍රමාණයකින් විකල්ප භාණ්ඩ සංයෝග නිපදවිය හැකි බව
   (iii) නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයක් පවතින බව
   (iv) එක් භාණ්ඩයකින් වැඩිපුර ඒකකයක් නිපැදවීමේ දී අනෙක් භාණ්ඩයෙන් කැප කළ යුතු ඒකක ගණන වැඩි වන බව.

5. නිෂ්පාදන හැකියා මායිමක් X අක්ෂයෙන් පමණක් දකුණට විතැන් වූයේ යැයි සිතන්න. එවැනි විතැන්වීමක් සිදු කළ හැකි සාධක හඳුනා ගන්න.
   (i) X සඳහා වෙළෙඳ පොළ ඉල්ලුම ඉහළ යෑම
   (ii) X කර්මාන්තයේ භාවිත වන යෙදවුම් වල පිරිවැය අඩු වීම
   (iii) X කර්මාන්තය වැඩි දියුණු කළ තාක්ෂණයක් යොදා ගැනීම
   (iv) Y කර්මාන්තයේ සිට X කර්මාන්තයට සම්පත් මාරු කිරීම

6. විවෘත ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතයට සමාන වන්නේ කුමන සංයෝගය ද?
   (i) $C + G + I$ (ii) $C + G + I + X$ (iii) $C + G + I + X_1 - M_1$ (iv) $C + G + I + X - M$

   C යන්නෙන් පරිභෝජනය ද, G යන්නෙන් රජයේ වියදම ද, I යන්නෙන් ආයෝජනය ද, X සහ M යනු පිළිවෙළින් සියලු භාණ්ඩ සහ සේවා අපනයන හා ආනයන ද, $X_1$ සහ $M_1$ යනු පිළිවෙළින් සාධක සේවා හැර අනෙකුත් සියලු භාණ්ඩ සහ සේවා අපනයන හා ආනයන ද දක්වේ.

7. ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශ හඳුනා ගන්න.
   (i) රටක මුළු නිමැවුමේ අගයෙන් අපනයන අගය අඩු කළ විට දළ දේශීය නිෂ්පාදිතය ලැබේ.
   (ii) දළ ජාතික නිෂ්පාදිතය යනු රටක වැසියන් විසින් නිපැදවූ මුළු නිමැවුමෙහි අගයයි.
   (iii) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යනු ස්ථාවර මිල යටතේ ගණනය කළ ජාතික නිමැවුම යි.
   (iv) සාධක පිරිවැය යටතේ දළ ජාතික නිෂ්පාදිතය යනු වක්‍ර බදු රහිත ජාතික නිමැවුම යි.

8. රජයක් සහ විදේශ වෙළෙඳාමක් නැති සරල ආර්ථිකයක නිමැවුම සමතුලිත තත්වයක පවතී යැයි උපකල්පනය කරන්න. ඉතුරුම් වැඩි කිරීමට කුටුම්භ තීරණය කළ ද ඊට අනුකූල ව ව්‍යාපාර ආයතන විසින් ආයෝජනය වැඩි නොකරන්නේ නම් සමතුලිතයට කුමක් සිදු වේ ද?
   (i) ආයෝජන මට්ටම ඉහළ දැමීමට රජය මැදිහත් වන අතර, ඒ අනුව ඉතුරුම් හා ආයෝජනය අතර සමානත්වය දිගට ම පවතිනු ඇත.
   (ii) නිෂ්පාදකයින් පෙර පැවැති නිමැවුම දිගට ම පවත්වා ගෙන යන අතර, අලෙවිය වැඩිකර ගැනීම නිසා සමතුලිතය නොවෙනස් ව පවතී.
   (iii) ආයෝජනයට වඩා ඉතුරුම් පවතින බැවින් ආදායමේ චක්‍රාකාර ප්‍රවාහය හැකිළෙන අතර සමතුලිත නිමැවුම් මට්ටම පහළ යනු ඇත.
   (iv) අතිරික්ත ඉතුරුම් නිසා පොලී අනුපාතිකය පහළ වැටෙන බැවින්, ආයෝජනය දිරි ගැන් වී සමතුලිතය නොවෙනස් ව පවතී.

www.pastpaperlk.com
www.artsapi.lk

සාර්ව ආර්ථික සමතුලිත තත්වය නිවැරදි ව විස්තර වන්නේ කුමන ප්‍රකාශයෙන් ද?
(i) එය උද්ධමනයක් නැති ස්ථාවර ලක්ෂයකි.
(ii) එය නිෂ්පාදනය උපරිම වන ලක්ෂයකි.
(iii) ආදායම් / නිමැවුම් මට්ටමෙහි වෙනසක් ඇති කෙරෙන බලවේග ක්‍රියාත්මක නොවන තත්වයක්
(iv) එය පූර්ණ සේවා නියුක්තියක් පවතින ලක්ෂයකි.

ආර්ථික විද්‍යාවේ බාල භාණ්ඩයක් වශයෙන් හඳුන්වන්නේ පහත ලක්ෂණය ඇති භාණ්ඩයකි.
(i) මිල පහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය නොවෙනස් ව පවතී.
(ii) ආදායමේ ඉහළ යෑමත් සමග ඉල්ලුම පහළ යයි.
(iii) මිල ඉහළ යෑමත් සමග ඉල්ලුම් ප්‍රමාණය පහළ යයි.
(iv) මිල ඉහළ යන විට පාරිභෝගිකයෝ වෙනත් භාණ්ඩවලට මාරු වෙති.

භාණ්ඩයක සැපයුම් වක්‍රය දකුණට විතැන් කෙරෙන සාධක හඳුනාගන්න.
(i) ඉල්ලුමේ ප්‍රසාරණයක් (ii) යෙදවුම් මිල පහළ යෑමක් (iii) තාක්ෂණයේ වැඩි දියුණුවක්
(iv) නිෂ්පාදනය වඩාත් ලාභදායී වන අයුරින් භාණ්ඩයේ මිල ඉහළ යෑමක්

භාණ්ඩයක සැපයුම් උච්චාවචනය වන විට එම භාණ්ඩයේ මිලෙහි විශාල උච්චාවචන සිදුවන්නේ කුමන තත්ව යටතේද?
(i) ඉල්ලුම් වක්‍රය ඉහළට බෑවුම් වන විට (ii) ඉල්ලුම ඉතා අනම්‍ය වන විට
(iii) ඉල්ලුම් ප්‍රමාණයේ සාපේක්ෂ වෙනස මිලෙහි සාපේක්ෂ වෙනසට වඩා බෙහෙවින් අඩු වූ විට
(iv) භාණ්ඩය බාල භාණ්ඩයක් වන විට

4. භාණ්ඩයක මිල වෙනස්වීම් සිදු වුව ද පාරිභෝගික වියදම් නො වෙනස් ව පැවතිය හැකි අවස්ථා හඳුනාගන්න.
(i) ඉල්ලුම ඒකීය නම්‍ය වූ විට
(ii) ඉල්ලුම පූර්ණ නම්‍ය වූ විට
(iii) සාපේක්ෂ වශයෙන් සුළු මිල වෙනස්වීම් පවතින විට
(iv) ඉල්ලුම් වක්‍රය සෘජු කෝණාස්‍ර බහුවලයක හැඩය ගත් විට

15. ඒකාධිකාරී තරඟයේ ව්‍යාපාර ආයතනයක් පූර්ණ, තරඟකාරී ව්‍යාපාර ආයතනයකින් වෙනස් වන්නේ කුමන කරුණු මගින් ද?
(i) ආයතනය ප්‍රභේදනය කර ඇති භාණ්ඩ විකුණයි.
(ii) ආයතනය සපයන භාණ්ඩයට ඇත්තේ පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකි.
(iii) නව ආයතනවලට ඇතුල්වීමට බාධා නැත.
(iv) ආයතනයට දිගු කාලයේ දී අධි ප්‍රමාණික ලාභ ඉපැයිය හැකි ය.

16. නිෂ්පාදනයේ බාහිරතා යන්නට ඇතුළත් කළ හැකි දෑ හඳුනාගන්න.
(i) නිෂ්පාදකයින්ට පාලනය කළ නොහැකි නියාමයක් වැනි බාහිර සාධක
(ii) නිෂ්පාදකයින්ට දැරීමට සිදු නොවන එහෙත් සමාජය මත පැටවෙන පිරිවැය
(iii) නිෂ්පාදකයින්ට නොලැබී වෙනත් අයට අත්වන නිෂ්පාදන වාසි
(iv) අපනයන වෙළෙඳ පොළවල ව්‍යාපාරික කටයුතු සඳහා දැරීමට සිදුවන පිරිවැය

17. පහත දැක්වෙන ලක්ෂණ අතරින් ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයේ දැකිය හැකි ඒවා මොනවා ද?
(i) වඩාත් ම වැදගත් බදු මූලාශ්‍රය වන්නේ සෘජු බදු ය.
(ii) බදු ආදායමින් වැඩි ම කොටසක් ලැබෙන්නේ වක්‍ර බදුවලිනි.
(iii) බදු පැහැර හැරීම සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී.
(iv) වඩාත් ම වැදගත් බද්ද ආදායම් බද්ද යි.
(v) වඩාත් ම වැදගත් බද්ද බාණ්ඩ හා සේවා බද්ද යි.

18. පහත දැක්වෙන රාජ්‍ය වියදම් අතරින් සංක්‍රාම වියදම් වශයෙන් ඔබ සලකන්නේ මොනවා ද?
(i) සෞඛ්‍ය සේවා වියදම (ii) විශ්‍රාම වැටුප් (iii) සමෘද්ධිලාභීන්ට කරන ගෙවීම්
(iv) යුද්ධ වියදම් (v) පෝෂණ සහනාධාරය

19. රාජ්‍ය අයවැයක වර්තන ගිණුමේ හිඟයක් මගින් පහත දැක්වෙන ප්‍රතිවිපාක ඇති කෙරේ.
(i) වර්තන වියදම්වලට පවා රජයට ණය ලබා ගැනීමට සිදු වේ.
(ii) රජයේ ඉතුරුම් සෘණ අගයක් ගනී.
(iii) රජයට ප්‍රාග්ධන වියදම් අඩු කිරීමට සිදු වේ.
(iv) රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීමට සිදු වේ.

20. සංවර්ධනය වන රටවල රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණයට හේතු වූ වැදගත් සාධක හඳුනාගන්න.
(i) රාජ්‍ය අයවැය සඳහා ආදායම වැඩිකර ගැනීමේ මාර්ගයක් වශයෙන් රජයේ වත්කම් විකිණීම
(ii) රාජ්‍ය ව්‍යවසායන් අකාර්යක්ෂමවීම සහ පාඩු විඳීම
(iii) වෙළෙඳ පොළ අර්ථක්‍රමය පැතිරීමත් සමග රජය වාණිජ කටයුතුවලින් බැහැර විය යුතු ය යන අදහස
(iv) රාජ්‍ය ව්‍යවසායන් මත බදු පැනවීමේ දුෂ්කරතාව

-----

www.pastpaperlk.com
www.artsapi.lk

# ආර්ථික විද්‍යාව I - පැය දෙකයි.
# Economics I - Two hours

## II කොටස

'අ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරා ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### 'අ' උප කොටස
(මේ කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

1. (i) වෙළෙඳ පොළ ආර්ථිකයක් හා මධ්‍ය සැලසුම් ආර්ථිකයක් අතර පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
   (ii) බොහෝ සමාජවාදී රටවල් මධ්‍ය සැලසුම් ක්‍රමය අත්හැර වෙළෙඳ පොළ ක්‍රමයට මාරුවීමට හේතු වූ ප්‍රධාන ආර්ථික සාධක කවරේ ද? (ලකුණු 10 යි.)

2. පහත දක්වෙන සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් යොදා ගනිමින් පැහැදිලි කරන්න.
   (i) 1990-1999 දස වසර තුළ දී එක්තරා ආර්ථිකයක් සියයට 50 කින් වර්ධනය විය.
   (ii) අන්තර්ජාතික වෙළෙඳපොළෙහි හුවමාරුව මගින් කිසියම් රටකට ස්වකීය නිෂ්පාදන හැකියා මායිමෙන් බාහිර වූ භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළ හැකි වේ.
   (iii) නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය එක්තරා අවස්ථාවක් දක්වා වැඩි වී ඉන්පසු ස්ථාවර වන තත්වයක් (එක් කොටසකට ලකුණු 05 යි.)

3. X භාණ්ඩය සඳහා වූ වෙළෙඳපොළ A,B,C යනුවෙන් පාරිභෝගිකයින් තිදෙනෙකු සිටිනැයි ද ඔවුන්ගේ පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිත පහත දක්වෙන පරිදි වේ යැයි ද සිතන්න.

   $Q_a = 1000 - 10 Px$

   $Q_b = 1400 - 14 Px$

   $Q_c = 2000 - 20 Px$

   (i) X භාණ්ඩය සඳහා වූ වෙළෙඳ පොළ ඉල්ලුම් ශ්‍රිතය දක්වන්න.
   (ii) X භාණ්ඩයේ වෙළෙඳ පොළ සැපයුම් ශ්‍රිතය $Qs = 20 Px$ වේ නම්, වෙළෙඳ පොළ සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න.
   (iii) සමතුලිත මිලෙහි දී ඒ ඒ පාරිභෝගිකයා ඉල්ලුම් කරන ප්‍රමාණ කවරේ ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

4. (i) ආන්තික ආදායම යනුවෙන් කුමක් අදහස් වේ ද? පූර්ණ තරඟකාරී ව්‍යාපාර ආයතනයක ආන්තික ආදායම හැසිරෙන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (ii) පූර්ණ තරඟකාරී ව්‍යාපාර ආයතනයක භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම් වක්‍රය හා ඒකාධිකාරී තරඟයක ව්‍යාපාර ආයතනයක භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම් වක්‍රය අතර වෙනස කවරේ ද? ඒ වෙනසට හේතුව පැහැදිලි කරන්න.
   (iii) පෞද්ගලික පිරිවැයට වැඩි සමාජ පිරිවැයක් පවතින විට ව්‍යාපාර ආයතනයක නිමැවුම ප්‍රශස්ත මට්ටමක නොපවතී යැයි නිගමනය කෙරෙන්නේ මන්ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

### 'ආ' උප කොටස
(මේ කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

5. (i) "රටක දළ දේශීය නිෂ්පාදිතය, එරට දළ දේශීය වියදම සමග සැමවිට ම සමාන වේ." මේ ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහි ද? පිළිතුර පැහැදිලි කරන්න.
   (ii) රටක ආර්ථික වර්ධනය මැනීම සඳහා එරටෙහි දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
   (iii) 1999 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය, ක්‍රය ශක්ති සාම්‍ය (ppp) ඩොලර් අනුව 3056 ක් වේ යැයි ගණන් බලා ඇත. මේ ප්‍රකාශයෙන් ඔබට කුමක් අදහස් වේ ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

6. (i) පිස්කල් (Fiscal) ප්‍රතිපත්තිය යනුවෙන් කුමක් අදහස් වේ ද?
   (ii) රාජ්‍ය අයවැයෙන් ජාතික ගිණුම්වලට ඇතුලත් කිරීම සඳහා වියදම් වර්ග තෝරා ගන්නේ කුමන නිර්ණායකයක් අනුව ද?
   (iii) සරල ආර්ථිකයක ආකෘතියකට රාජ්‍ය කටයුතු ඇතුළත් කළ විට සමතුලිත නිමැවුමේ හා ආදායම් ගුණකයේ සිදුවන වෙනස්කම් මොනවා ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

7. (i) පොදු (සමාජ) භාණ්ඩයක ප්‍රධාන ලක්ෂණ කවරේ ද? එවැනි භාණ්ඩයක් සඳහා නිදසුන් දෙකක් සපයන්න.
   (ii) ගුණකාරක භාණ්ඩ (Merit Goooda) යනු කවරේ ද? නිදසුන් දෙකක් සපයමින් පැහැදිලි කරන්න.
   (iii) සමාජයක් තුළ ආර්ථික සාධාරණත්වය ඇති කිරීම සඳහා [illegible] (එක් කොටසකට ලකුණු 05 යි.)

8. (i) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ සංයුතියේ ඔබ දකින වැදගත් ලක්ෂණ කවරේ ද?
   (ii) පොදු ආර්ථික ප්‍රතිපත්තියක් වශයෙන් පෞද්ගලීකරණය යන්නට ඔබ ඇතුළත් කරන දෑ මොනවා ද?
   (iii) "රාජ්‍ය අයවැයෙහි හිඟයේ ප්‍රමාණය එතරම් වැදගත් නොවේ. වැදගත් කරුණ නම් උද්ධමනකාරී නොවන මාර්ග යොදා ගෙන අයවැය හිඟය පියවීම යි." මේ අදහසට ඔබ එකඟ වන්නෙහි ද? හේතු දක්වන්න. (එක් කොටසකට ලකුණු 05 යි.)

-----

www.pastpaperlk.com
www.artsapi.lk